බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

| | | | |
|---|---|---|---|
| මගේ අංකය My Number | USJP/BA/EEX15 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10, Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය Your Number | | | |
| දුරකථනය Telephone | 011-3132496, 0115929791, 0115929790 | වෙබ් අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | 011-2802753 | විද්‍යුත් තැපැල E-mail | ext.certi@sjp.ac.lk |


2021.03.12

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව - 2020

ගරු ස්වාමීන් වහන්ස/ මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනවියනි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් බාහිර උපාධි පාඨමාලාවට **අවශ්‍ය සුදුසුකම් සනාථ කිරීමට යටත්ව** ලියාපදිංචිය සඳහා විෂයන් තෝරා ගත යුතුය. 2021 ජනවාරි 15 දිනැති අංක 01/2021 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව විෂයයන් තෝරා ගැනීමේ ක්‍රමවේදය සංශෝධනය කර ඇති අතර එකී සංශෝධනයන්ට අනුකූලව ඔබ විසින් ලියාපදිංචි වීම සිදු කළ යුතු වේ.

ඒ අනුව මෙම උපාධි පාඨමාලාවට අදාළ සියලුම විෂයයන් විෂය කාණ්ඩ 03 කට වර්ගීකරණය කර ඇත. එම විෂය කාණ්ඩ පහත දැක්වේ.

| **01 කාණ්ඩය**<br>එක් විෂයක් පමණි | **02 කාණ්ඩය**<br>විෂයයන් එකක් හෝ දෙකක් පමණි | **03 කාණ්ඩය**<br>එක් විෂයක් පමණි |
|---|---|---|
| ❖ සිංහල<br>❖ සමාජ විද්‍යාව<br>❖ දේශපාලන විද්‍යාව<br>❖ මනෝවිද්‍යාව<br>❖ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය<br>❖ ඉතිහාසය | ❖ සමාජ සංඛ්‍යානය<br>❖ ආර්ථික විද්‍යාව<br>❖ ඉංග්‍රීසි<br>❖ පුරාවිද්‍යාව<br>❖ භූගෝල විද්‍යාව<br>❖ ජාත්‍යන්තර සම්බන්ධතා<br>❖ පාලි<br>❖ අපරාධ විද්‍යාව | ❖ මානව විද්‍යාව<br>❖ සංස්කෘත<br>❖ බෞද්ධ දර්ශනය<br>❖ සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය<br>❖ සංගීතය<br>❖ නාට්‍ය රංගකලාව<br>❖ නර්තනය<br>❖ දර්ශනය<br>❖ හින්දි<br>❖ බෞද්ධ ශිෂ්ටාචාරය |

එබැවින් මෙම උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විෂයයන් තෝරා ගත හැකි ක්‍රමවේදය වන්නේ,

**ක්‍රමවේදය 01 - : පහත සඳහන් විෂය කාණ්ඩ 03 න් එක් විෂය බැගින් විෂයයන් 03 ක් තෝරා ගැනීම.**

මේ යටතේ අයදුම්පත සම්පූර්ණ කරන්නේ නම් වෙබ් අඩවියෙහි පළකොට ඇති අයදුම්පතෙහි පළමු විෂය කාණ්ඩයට 1 ද දෙවන විෂය කාණ්ඩයට 1 ද තෙවන විෂය කාණ්ඩයට 1 ද යෙදිය යුතුය. ඉන්පසු **කාණ්ඩ 03හි සියළුම විෂයයන්** සඳහා තමාගේ මනාපය අනුපිළිවෙළින් ඒ ඒ විෂය කාණ්ඩය සඳහා ඉදිරිපත් කළ යුතුය.

**ක්‍රමවේදය 02 - : 01 වන විෂය කාණ්ඩයෙන් එක් විෂයයක් හා 02 වන විෂය කාණ්ඩයෙන් විෂයයන් 02 ක් තෝරා ගැනීම.**

මේ යටතේ අයදුම්පත සම්පූර්ණ කරන්නේ නම් වෙබ් අඩවියෙහි පළකොට ඇති අයදුම්පතෙහි පළමු විෂය කාණ්ඩයට 1 ද දෙවන විෂය කණ්ඩයට 2 ද තෙවන විෂය කාණ්ඩය සඳහා 0 ද යෙදිය යුතුය. ඉන්පසු **කාණ්ඩ 03හි සියළුම විෂයයන්** සඳහා තමාගේ මනාපය අනුපිළිවෙළින් ඒ ඒ විෂය කාණ්ඩය සඳහා ඉදිරිපත් කළ යුතුය.

විෂයයන් තෝරා ගැනීමෙන් අනතුරුව **www.external.sjp.ac.lk/reg** යන අපගේ වෙබ් අඩවියෙහි පළ කර ඇති අයදුම්පත සම්පූර්ණ කර මාර්ගගත ක්‍රමවේද ඔස්සේ යොමු කළ **(Submit)** යුතුය. සම්පූර්ණ කරන ලද ඔබගේ තොරතුරු පත්‍රිකාව 2021.03.26 වන දිනට පෙර නියෝජ්‍ය ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවන මෙන් දන්වා සිටිමි.

යම් විෂයයක් සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා යන විට ඔබේ මනාපයේ අනුපිළිවෙළ අනුව විෂයයන් සඳහා අනුයුක්ත කිරීම සිදු කරනු ලබයි.

ඔබගේ ලේඛන සහ සහතිකවල මුල් පිටපත් සහ ගෙවීම් සම්බන්ධ රිසිට් පත් පරීක්ෂා කිරීම් සිදු කරනු ලබන දිනයන් ඉදිරියේදී දැනුම් දෙනු ලැබේ.

**<u>සැළකිය යුතුයි ඃ-</u>**

I. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අදාළ වන නියමිත අවශ්‍යතා ඔබ විසින් සපුරා නොමැති බව හෙළි වුවහොත් ඔබගේ බාහිර උපාධි අපේක්ෂක ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.

II. ඔබට ලියාපදිංචි විය හැක්කේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ එක් බාහිර උපාධි පාඨමාලාවක් සඳහා පමණි. එම ලියාපදිංචිය වලංගු කාල සීමාව තුළ ඔබට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෙනත් බාහිර උපාධි පාඨමාලාවක් සඳහා ලියාපදිංචි විය නොහැකිය.

III. එක් උපාධි පාඨමාලාවක් සඳහා ලියාපංදිචි වූ අයෙකුට පසුව වෙනත් උපාධි පාඨමාලාවකට මාරු වීමට කිසිසේත්ම අවසර දෙනු නොලැබේ.

IV. ලියාපදිංචි ගාස්තු හෝ පාඨමාලා ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

V. නර්තනය හා සංගීතය විෂයන් සඳහා සිසුන් තෝරා ගැනීමට ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වන අතර එම විෂයන් හැදෑරීමට පරීක්ෂණයෙන් සමත් විය යුතුය. පරීක්ෂණයෙන් අසමත් වන සිසුන් ඒ වෙනුවට වෙනත් විෂයයක් තෝරා ගත යුතුය.

VI. ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස හැදෑරීම සඳහා ද පරීක්ෂණයක් පවත්වන අතර ඔබ එම පරීක්ෂණයෙන් සමත් විය යුතුය. (අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණය සඳහා ප්‍රධාන විෂයයක් ලෙස ඉංග්‍රීසි විෂයය හදාරා අවම වශයෙන් 'S' සාමාර්ථයන් ලබා තිබේ නම් පරීක්ෂණයට පෙනී සිටීම අවශ්‍ය නොවේ.)

VII. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමට අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණය සඳහා ජනසන්නිවේදනය විෂයය හදාරා තිබිය යුතුය.

VIII. **ඔබ විසින් තෝරා ගන්නා ලද විෂයයන් නැවත සංශෝධනය කිරීමට අවස්ථාවක් නොමැත.**

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2021.03.12

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
තැ.පෙ. 10, ගංගොඩවිල, නුගේගොඩ